පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

දෙවන වාරය- ජූනි මාසය - සතිය - 03

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක ජාතික පාසැල , කලවාන.

# උඩරට නර්තන සම්ප්‍රදාය.

නිපුණතා මට්ටම : සරල රංග උපකරණයක් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම :රංග උපකරණයක් නිර්මාණය කරමු. (කුල්ල, දැකැත්ත හා මෝල්ගස)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඒ ඒ භාණ්ඩය නිර්මාණයට අවශ්‍ය අමුද්‍රව්‍ය රැස්කරගන්න..

දෙවන පියවර : ඒ ඒ භාණ්ඩ පිළිබඳව වැඩිහිටියන්ගේ අදහස් විමසන්න.

තුන්වන පියවර : වැඩිහිටි උපදෙස්මත හෝ රූප සටහන් ඇසුරින් ඒවා පිළිබඳව අධ්‍යනයක යෙදෙන්න.

හතරවන පියවර : ඒ අධ්‍යනයන් ඇසුරින් එක් එක් රංග භාණ්ඩ නිර්මාණය කරන්න.

පස්වන පියවර : රංග භාණ්ඩයන් නිර්මාණය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීය හැකිදැයි බලන්න.

1. එක් එක් රංග උපකරණය නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත් අමුද්‍රව්‍ය සඳහන් කරන්න.
2. එක් එක් උපකරණ සඳහා එකී අමුද්‍රව්‍ය සුදුසු පරිදි සකස් කරගත් ආකාරය විස්තර කරන්න.
3. එක් එක් උපකරණයේ මූලික සැකැස්ම(ආකෘතිය) සකස් කළ අයුරු පැහැදිලි කරන්න.
4. ඉහත රංග උපකරණයන් නිර්මාණය කළ ආකාරය ලියන්න.

කුල්ල නිර්මාණය
අමුද්‍රව්‍ය - කොළපත්/කාඩ්බෝඩ්/බ්‍රිස්ටල් බෝඩ්, වර්ණ කඩදාසි ආදි වශයෙන් සුදුසු අමුද්‍රව්‍ය යොදාගන්න.
අනතුරු ව කුල්ලක ආකෘතියක් සකස් කරගන්න.
ඒ සඳහා රූප සටහන් හෝ වැඩිහිටයන්ගේ උපදෙස් ලබාගන්න.ඔබ සකසා ගත් උපකරණය පාසැල් ආරම්භවීමෙන් පසු නර්තන ක්‍රියාකාරකම් සඳහා භාවිතාකිරීමට රැගෙන එන්න.



දැකැත්ත නිර්මාණය
අමුද්‍රව්‍ය - කාඩ්බෝඩ් හාර්ඩ්බෝඩ් බෙලෙක් තහඩු වර්ණ කඩදාසි අදිය.
දැකැත්තෙහි ආකෘතියක් නිර්මාණය කිරීම.
ඒ සඳහා රූප සටහන් හෝ වැඩිහිටයන්ගේ උපදෙස් ලබාගන්න.ඔබ සකසා ගත් උපකරණය පාසැල් ආරම්භවීමෙන් පසු නර්තන ක්‍රියාකාරකම් සඳහා භාවිතාකිරීමට රැගෙන එන්න.



මෝල් ගස නිර්මාණය
අමුද්‍රව්‍ය - ප්ලාස්ටික් බටයක් (අගල් 2-2.5),End cup 2ක්/උණ ගසක්/තරමක් ගණකමින් යුත් ලී දණ්ඩක් වර්ණ කඩදාසි අදිය.
මෝල් ගසක ආකෘතියක් නිර්මාණය කිරීම. ඒ සඳහා රූප සටහන් හෝ වැඩිහිටයන්ගේ උපදෙස් ලබාගන්න.
ඔබ සකසා ගත් උපකරණය පාසැල් ආරම්භවීමෙන් පසු නර්තන ක්‍රියාකාරකම් සඳහා භාවිතාකිරීමට රැගෙන එන්න.

